# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

# 2018 අංක 16 දරන ජාතික ආරක්ෂක අරමුදල් (සංශෝධන) පනත

**[සහතිකය සටහන් කළේ 2018 ජූනි මස 22 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.


2018 ජූනි මස 22 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකි ය.

**මිල :** රු. 8.00 **තැපැල් ගාස්තුව :** රු. 10.00

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## 2018 අංක 16 දරන ජාතික ආරක්ෂක අරමුදල් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2018 ජුනි මස 22 වන දින]

එල්. ඩී.—ඕ. 34/2017

**1985 අංක 9 දරන ජාතික ආරක්ෂක අරමුදල් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 2018 අංක 16 දරන ජාතික ආරක්ෂක අරමුදල් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1985 අංක 9 දරන ජාතික ආරක්ෂක අරමුදල් පනතේ 3 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— 1985 අංක 9 දරන පනතේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) සහ (ආ) ඡේද ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:—

''(අ) පහත දැක්වෙන නිලබලයෙන් පත්වන සාමාජිකයන්:—

(i) ජනරජයේ ජනාධිපති ලේකම්වරයා;

(ii) ආරක්ෂක විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා; සහ'';

(2) එම වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදය නැවත (ආ) ඡේදය වශයෙන් අංකනය කිරීමෙන්; සහ

(3) (3) වන සහ (4) වන උපවගන්තිවල ''(2) වන උපවගන්තියේ (ඇ) ඡේදය'' යන වචන සහ ඉලක්කම් වෙනුවට ''(2) වන උපවගන්තියේ (ආ) ඡේදය'' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තියෙහි ''ජනාධිපතිවරයා'' යන වචනය වෙනුවට ''ජනරජයේ ජනාධිපති ලේකම්වරයා'' යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.

ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තියෙහි ''මුදල්,'' යන වචනය වෙනුවට ''ආරක්ෂක,'' යන වචනය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**5.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැකි ය.